චක්‍ර ලේඛ අංක: - එච්ආර්ඩී/එච්ඩීඩී/2002/20


දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා
அமைச்சர்
Minister
784807
784832

ලේකම්
செயலாளர்
Secretary
784811

කාර්යාලය
அலுவலகம்
Office
785141-50
Fax: 784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : secedu@sltnet.lk

මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
மனிதவள அபிவிருத்தி, கல்வி, பண்பாட்டு அலுவல்கள் அமைச்சு
Ministry of Human Resources Development, Education & Cultural Affairs
පාසල් කටයුතු ශාඛාව
'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල.
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை.
பத்தரமுல்ல.
"Isurupaya", Sri Jayawardhanapura Kotte.
Battaramulla.


ඔබේ අංකය
உமது இல.
Your No. ....................

මගේ අංකය
எமது இல.
My No. 2/පාස/4/28

දිනය
திகதி
Date 2002.08.15

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම පාසල්වල විදුහල්පතිවරුන්
සියලුම පිරිවෙනාධිපති හිමිවරුන් වෙත

<u>5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල මත ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම සඳහා සලකා බලන දෙමාපියන්ගේ / නීත්‍යානුකූල භාරකරුවන්ගේ වාර්ෂික ආදායම් සීමාව සංශෝධනය කිරීම.</u>

5 වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල මත ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීම සඳහා දැනට සලකා බලන දෙමාපියන්ගේ /නීත්‍යානුකූල භාරකරුවන්ගේ වාර්ෂික ආදායම් සීමාව වන්නේ රුපියල් 6000.00 කි. එනම් මසකට රුපියල් 500.00 කි. මෙම ආදායම් සීමාව වසර 24 ක සිට ක්‍රියාත්මක වන්නක් බැවින් එය කාලෝචිත ලෙස වෙනස් කිරීමට අමාත්‍යාංශය තීරණය කර ඇත.

02. ඒ අනුව 2004 වර්ෂයේ ජනවාරි මස සිට ශිෂ්‍යාධාර පිරිනැමීම සඳහා සලකා බලන දෙමාපියන්ගේ / නීත්‍යානුකූල භාරකරුවන්ගේ සියලුම මාර්ගවලින් ලැබෙන සම්පූර්ණ වාර්ෂික ආදායම රුපියල් 24000.00 හෝ ඊට අඩු විය යුතුය. එනම් මසකට රුපියල් 2000.00 හෝ ඊට අඩු විය යුතුය. 'සමෘද්ධි' වැඩ සටහන ක්‍රියාත්මක කිරීම නිසා ලැබෙන ප්‍රදානයන් මෙම ආදායම් සීමාවට බලපාන්නේ නැත.

03. ඒ අනුව ඉහත සංශෝධනය 2003 වර්ෂයේ සිට ඉදිරියට 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා බල පැවැත්වෙනු ඇත.

I. ශිෂ්‍යාධාර හිමිවීමේ නව ආදායම් සීමාව වන රුපියල් 24000.00 බලපැවැත්වෙන්නේ 2003 වර්ෂයේ සිට පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට ඉදිරිපත්වන අයදුම්කරුවන් හට පමණි.

II. මෙම ආදායම් සීමාවේ වෙනස 2003 වර්ෂයේදී 6 වන ශ්‍රේණියට ඇතුළත් වන සිසුන්ට ශිෂ්‍යාධාර ගෙවීමේදී අදාළ නොවේ. නව ආදායම් සීමා සංශෝධන යටතේ ශිෂ්‍යාධාර ගෙවනු ලබන්නේ 2004 වර්ෂයේ සිටය.

04. 2003 වර්ෂයේ සිට ඉදිරියට ශිෂ්‍යාධාර ලබාදීමේදී මෙම ලිපියේ උපදෙස් පරිදි කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

වී.කේ. නානායක්කාර
ලේකම්,
මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත් -
1. විභාග කොමසාරිස් ජනරාල්
2. සභාපති - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
3. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
4. ප්‍රධාන ගණකාධිකාරී - අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
5. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්